Worked

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,602 — 1958 නොවැම්බර් 27 වැනි බ්‍රහස්පතින්ද — 27.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**සී 281 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය**

**කරවල සහ වියළි ඉස්සෝ**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මිළ (ආහාර) පාලක තැන්පත් කොටුවේ මුහන්දිරම් ධර්මසේන ජයනෙත්ති වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිළ (ආහාර) පාලක තැන කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

(i) අංක 11,352 සහ 1958 ජූනි 9 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක සී 272 සහ 1958 ජූනි 9 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති පළමුවන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වර්ගවලට අයත් කරවල සහ වියළි ඉස්සන් පිටරටින් මෙරටට බඩු ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුඩබර හොණ්ඩරයක්ද, තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී ශුඩබර හොණ්ඩරයක්ද, කොළඹ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මීට යාකර ඇති දෙවෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වර්ගවලට අයත් කරවල සහ වියළි ඉස්සන් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුඩ බර රාත්තලක්, කොළඹ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිල මේ උපලෙඛනයේ 2 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) කරවල හෝ වියළි ඉස්සන් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ කරවල හෝ වියළි ඉස්සන් වරකට ශුඩබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත් ;

(ආ) කරවල හෝ වියළි ඉස්සන් නැවත විකිණීම සඳහා හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා ශුඩබර හොණ්ඩරයකට අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත් ;

(ඇ) කිසියම් කෙනෙකුගේ නාමයෙන් කරවල හෝ වියළි ඉස්සන් රේගුවෙන් ඉවත් කරගත් විට එකී පුද්ගලයා '' පිටරටින් මෙරටට බඩු ගෙන්වන්නෙකු '' ලෙස සළකන බවත් ;

(ඈ) කරවල හෝ වියළි ඉස්සන් තොග වශයෙන් විකිණීමට පුරුදුව සිටින කවරෙකු හෝ තොග වෙළෙන්දෙකු ලෙස සළකන බවත් ;

(ඉ) කොළඹ නාගරික සීමාවන් තුළ විකිණීම සඳහා නියමිත '' මෙරටට බඩු ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී වැඩිම මිළ '' මෙරටට බඩු ගෙන්වන්නෙකු විසින් තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී ද බලපවත්වන බවත් ;

(ඊ) කොළඹ නාගරික සීමාවන් තුළ විකිණීම සඳහා නියමිත '' තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී වැඩිම මිළ '' මෙරටට බඩු ගෙන්වන්නෙකු තොග වෙළෙන්දෙකුට විකිණීමේදී හැර සියළුම තොග වශයෙන් විකිණීම් වලදී බලපවත්වන බවත් ;

(උ) '' සිල්ලර වශයෙන් විකිණීමේදී වැඩිම මිළ '' සියළුම සිල්ලර වශයෙන් විකිණීම් සඳහා බලපවත්වන බවත් ;

(ඌ) '' වේලන ලද මාළු '' සහ '' කරවල '' එකසේ සළකන බවත් ;

(v) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, පළමුවන උපලේඛනයේ 1 වෙනි තීරයේ සහ දෙවෙනි උපලේඛනයේ 1වෙනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නො විකිණිය යුතු බවත් නියම කරමි.

(vi) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක පළමුවන උපලේඛනයේ 1 වැනි තීරයේ සහ දෙවෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කරවල හෝ වියළි ඉස්සන් තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(vii) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා — " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(viii) තවද මෙම නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, පළමුවන උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා දෙවෙනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ ද්‍රව්‍යයේ විස්තර ;
(ඇ) විකුණූ ප්‍රමාණය (දලබර සහ ශුඬබර) ;
(ඈ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඉ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

(ix) පළමුවෙනි හා දෙවෙනි උපලේඛනවල 1 වෙනි තීරයන්හි සඳහන් කරවල සහ වියළි ඉස්සන් විකුණන විට, ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත්, 1 වෙනි උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් මිළ ගණන්වල හා 2 වෙනි උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන්වල ඇතුළත්වන බව ද නියම කරමි.

(x) තවද, කුම්බලා, බොම්බිලි හාල්මැස්සන් සහ වියළි ඉස්සන් හැර උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් වෙනත් කරවල කිසිවක බහා විකුණන විට එම කරවල බහා ඇති එක එක භාණ්ඩය සඳහා දලබරින් තාරබර ලෙස අඩුම වශයෙන් රාත්තල් දහය බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(xi) උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් කුම්බලාවුන් කිසිවක බහා විකුණන විට, ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දලබරින් තාරබර ලෙස අඩුම වශයෙන් රාත්තල් විසිපහ බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(xii) උප ලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් බොම්බිලි කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දලබරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් අට බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද ;

(xiii) උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් හාල් මැස්සන් කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දලබරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විස්ස බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද ;

(xiv) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වියළි ඉස්සන් ලෙලි රහිතව හෝ සහිතව කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දලබරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් පහලොහ බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද ;

(xv) මෙම නියෝගය සඳහා " ශුඬ " යන්නෙන් හැඟවෙන්නේ දලබරින් තාර බර අඩුකොට ඉතිරිවන බර හෝ කරවල නැතහොත් වියළි ඉස්සන්ගේ පමණක් බර බවද නියම කරමි.

ධර්මසේන ජයනෙත්ති,
මිළ (ආහාර) පාලක තැන.

1958 නොවැම්බර් මස 26 වෙනි දින පූ.භා. 11 ට කොළඹදී අත්සන් කරන ලදී.

## පළමුවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| විස්තරය | මෙරටට බඩු ගෙන්වන්නෙකු තොග වශයෙන් විකිණීමේදී ශුඬ බර හොණ්ඩරයක වැඩිම මිළ | තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී ශුඬ බර හොණ්ඩරයක වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| හිස රහිත තෝර ... ... ... | 110 0 | 115 50 |
| හිස සහිත තෝර ... ... ... | 92 0 | 97 0 |
| හිස රහිත කට්ටා ... ... ... | 80 0 | 85 0 |
| කට්ටා සම්පූර්ණයෙන් ... ... ... | 60 0 | 65 0 |
| හිස සහිත අන්ජිලා ... ... ... | 54 0 | 59 0 |
| හිස රහිත අන්ජිලා ... ... ... | 58 0 | 63 0 |
| හිස රහිත පරව් ... ... ... | 90 0 | 95 0 |
| හිස සහිත පරව් ... ... ... | 72 0 | 77 0 |
| හිස රහිත කොඩුවා ... ... ... | 80 0 | 85 0 |
| හිස සහිත කොඩුවා ... ... ... | 56 0 | 61 81 |
| බලයා ... ... ... ... | 80 0 | 85 0 |
| තොන්ඩ ... ... ... ... | 60 5 | 65 0 |
| කුම්බලා ... ... ... ... | 22 50 | 27 50 |
| බොම්බිලි ... ... ... ... | 72 0 | 77 0 |
| හාල් මැස්සෝ ... ... ... | 68 0 | 73 0 |
| ලෙලි රහිත වියලි ඉස්සෝ ... ... ... | 110 0 | 115 50 |
| ලෙලි සහිත වියලි ඉස්සෝ ... ... ... | 86 0 | 91 0 |

## දෙවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය |
|---|---|
| විස්තරය | සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ඬ බර රාත්තලක වැඩිම මිළ |
| | රු. ශ. |
| තෝර ... ... ... ... | 1 23 |
| කට්ටා ... ... ... ... | 0 87 |
| අන්ජිලා ... ... ... ... | 0 70 |
| පරව් ... ... ... ... | 1 0 |
| කොඩුවා ... ... ... ... | 0 85 |
| බලයා ... ... ... ... | 0 95 |
| තොන්ඩ ... ... ... ... | 0 70 |
| කුම්බලා ... ... ... ... | 0 30 |
| බොම්බිලි ... ... ... ... | 0 90 |
| හාල්මැස්සෝ ... ... ... ... | 0 85 |
| ලෙලි රහිත වියළි ඉස්සෝ ... ... ... | 1 10 |
| ලෙලි සහිත වියළි ඉස්සෝ ... ... ... | 0 85 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.